# 11 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 21 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 21 පාඩම

# දැහැමි ව උපයා දැහැමි ව වැය කරමු

# පත්තකම්ම සූත්‍රය

- අනේපිඬු මහ සිටුතුමාට බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි.
- ධනය පරිහරණය කිරීමට අදාළ කළමනාකරණය මෙම සූත්‍රයේ දැක්වේ.

# පත්තකම්ම යනු...

- සුදුසු ක්‍රියාව හෙවත් කළ යුත්තයි
- පහත දැක්වෙන සිව් ආකාර වූ ප්‍රාප්ත කර්ම (පත්තකම්ම) ක්‍රියාවට නැගීම නුවණැති සැබෑ ගිහි බෞද්ධයකුගේ වගකීමයි

# බෞද්ධයෙකු විසින් තම උත්සාහයෙන්, ශක්තියෙන් හා දැහැමින් උපයා ගත් ධනය පරිභෝග කළ යුතු ආකාර 04

1. තමාගේ සැපත සතුට සඳහා මෙන්ම තමා වටාහා සිටින අන් අයගේ ද සැපත සතුට සඳහා
2. ගින්නෙන්, ජලයෙන්, අදැහැමි රජ දරුවන්ගෙන්, සොරුන්ගෙන් හා තමා ප්‍රිය නොකරන පුද්ගලයන්ගෙන් ආරක්ෂා කර ගැනීම මගින්
3. පංචබලි නම් වූ යුතුකම් පහ ඉටු කිරීම සඳහා
4. මහණ බමුණන්ට දන් දීම, පූජා පැවැත්වීම සඳහා

# ගිහි බෞද්ධයෙකුගේ ධන පරිහරණය

ආත්මාර්ථය හා පරාර්ථය වෙනුවෙන්

විවිධ උවදුරුවලින් ආරක්ෂා කර ගැනීම

පංච බලි නම් වූ යුතුකම් ඉටු කිරීම

පැවිදි උතුමන්ට දානාදියෙන් සංග්‍රහ කිරීම

# පත්තකම්ම සූත්‍රයේ සඳහන් පංචබලි

01. ඥාතිබලි - උපයාගත් ධනයෙන් ඥාතීන්ට සැලකීම

02. අතිථිබලි - ආගන්තුක සත්කාරය

03. පුබ්බපේතබලි - මියගිය ඥාතීන්ට යුතුකම් ඉටු කිරීම

04. රාජබලි - රට වැසියන් වශයෙන් රජයට යුතුකම් ඉටු කිරීම

05. දේවතාබලි - දෙවියන්ට පින් දීම/ ආගමික කටයුතු කිරීම

# තෙරුවන් සරණයි..!